# 'TOWA BODY COATING SYSTEM' ඔබේ වාහනයටත්...

දශකයකට ආසන්න කාලයක් පුරා වාහන සේවා සැපයුම් ක්ෂෙත්‍රය හා බැඳි කීර්තිමත් නාමයක් වන ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම ජපන් වාහන සඳහා ප්‍රථම වරට Sterling Aftercare Guarantee වගකීම් සහතිකය පිරිනමමින් ලොව අංක එකේ රථවාහන වගකීම් සහතිකයකට හිමිකම් කියන්නට මෙරට වාහන හිමිකරුවන් වෙත අවස්ථාව උදා කර දෙන ලදී. ඉන් නොනැවතුණු ස්ටර්ලින් ඔටෝමොබයිල්ස් ලංකා (පුද්) සමාගම යුරෝපීය මාදිලිවල වාහන සඳහා පූර්ණ සේවා සහ කාර්මික අලුත්වැඩියාවන් සැපයීමත් ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලද සියලුම වාහන හිමිකරුවන් සඳහා අලෙවියෙන් පසු සුවිශේෂී ප්‍රතිලාභ හිමිකර දෙන්නටද ක්‍රියා කරන ලදී. එලෙස රථවාහන ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණය මුසු කළ සේවා ලාංකික ජනතාවට ලබා දුන් ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම මෙරට වෙළඳපළට තවත් විප්ලවීය සේවාවක් හඳුන්වා දුන්නේය. මෙම නව නිපැයුම වන්නේ ජපන් තාක්ෂණයෙන් නිමවන ලද 'TowaBody Coating System' නම් වාහන බඳ ආරක්ෂණ පද්ධතියයි. ඒ පිළිබඳව Sterling Aftercare Centre හි මෙහෙයුම් පිළිබඳ සහකාර සාමාන්‍යාධිකාරී හඳුවල දේවගේ නිලන්ත සිරි මහතා සමඟ කළ සාකච්ඡාවක් පහතින් දිග හැරේ.



**■ වාහනවල බඳෙහි වර්ණයට හානි පමුණුවන හේතු සාධක මොනවාද?**

සෑම වාහනයකම බඳ කොටස සඳහා හානි විය හැකි දිගුකාලීන හේතු මෙන්ම කෙටි කාලීන හේතු සාධක රාශියක් පවතිනවා. සර්ම කලාපීය රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ රථවාහනවල බඳ කොටස් වැඩි වශයෙන් හානියට පත්වන්නේ හිරු එළියට නිරාවරණය වීම නිසයි. ඊට අමතරව විවිධ වර්ගයේ රසායනික ද්‍රව්‍ය වැටීම හෝ භාවිතය, වාහනය පාරේ ගමන්ගන්නා විට බඳ කොටසට හානි සිදුවිය හැකි ද්‍රව්‍ය වැදීම නිසාවෙන්ද වාහනයේ බඳ ඉතා කෙටි කාලයක් තුළ දුර්වර්ණ වී දීප්තිමත්භාවය නැතිව යනවා. අධික දූහුවිල්ල නිසාවෙන්ද ජලයට වැඩි වශයෙන් නිරාවරණය වීම නිසාද වාහනයේ බඳෙහි දීප්තිමත්භාවය අඩු වන්නට පුළුවන්.

**■ මේ සියලු ගැටලු සඳහා පිළියම් ලෙස ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම හඳුන්වා දුන් TowaBody Coating System පිළිබඳව සඳහන් කරනවා නම්...**

TowaBody Coating System වාහන බඳ ආරක්ෂණ පද්ධතිය ජපානයේ නිෂ්පාදිත බොහෝ වාහන සඳහා යොදා තිබෙනවා. එසේ නොමැති වාහන දිවයින පුරා පිහිටි Sterling Aftercare මධ්‍යස්ථාන කරා රැගෙන ඒමෙන් TowaBody Coating System වාහන බඳ ආරක්ෂණ පද්ධතිය යෙදීමේ හැකියාව පවතිනවා. ජපන් තාක්ෂණයෙන් සමන්විත මෙම බඳ ආරක්ෂණ පද්ධතිය හඳුන්වා දීමේ කාර්යයයේදී පුරෝගාමීව කටයුතු කළ ජපන් ජාතික සිතෝ ශින්ගි මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම සේවාව අප මධ්‍යස්ථානවලදී ලබා ගන්නට පුළුවන්. ඒ සඳහාම විශේෂිත පුහුණුවක් ලැබූ සේවක මඬුල්ලකින්ද අප සෑම ශාඛාවක්ම සන්නද්ධ වී සිටිනවා. ජපානයේ පිහිටි අපගේ මවු සමාගම සමඟ අප නිරතුරුවම සම්බන්ධතා පවත්වනවා. ඒ නිසා තත්ත්වයෙන් උසස් විශ්වාසදායී අසමසම සේවාවක් ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගමෙන් ශ්‍රී ලාංකික ජනතාව වෙත ලබා දීමට අපි නිරතුරුවම ක්‍රියා කරනවා.




**■ මෙම වාහන බඳ ආරක්ෂණ පද්ධතිය වාහනයක් සඳහා යෙදීමෙන් ලැබෙන වාසි මොනවාද?**

අලුතින්ම වාහනයක් මිලදී ගන්නට බලාපොරොත්තු වෙනවා නම් මුල් අවස්ථාවේම TowaBody Coating System එක යෙදීමෙන් වාහනයේ බඳට උපරිම ආරක්ෂාවක් සමඟ දිගුකල් පවතින දීප්තිමත් භාවයක් ලබා ගත හැකි වෙනවා. වාහනයක් කාලයක් පාවිච්චි කිරීමේදී වාහන හිමිකරුටත් නොදැනීම වාහනයේ බඳ කොටස්වල දීප්තිය අඩු වෙනවා. නමුත් වාහනයක් මිලදී ගත් අවස්ථාවේම TowaBody Coating System එක යෙදුවහොත් එය සෑහෙන තරමකින් පාලනය කර ගැනීමේ හැකියාව ලැබෙනවා. නිතර නිතර ජලයට නිරාවරණය වීම නිසාත් වාහනයේ බඳට හානි සිදු වෙනවා. නමුත් වාහනයකට TowaBody Coating System යොදා ඇත්නම් වාහන බඳෙහි වතුර රැඳීමේ ස්වභාවය 0%දක්වා ප්‍රතිශතයක් කරා ගෙන යනවා.

වාහනයේ බඳෙහි වර්ණය දිගුකාලයක් පුරා දීප්තිමත් ලෙසත් ආරක්ෂාකාරී ලෙසත් පවත්වාගෙන යාමට Towa ආලේපනයට හැකියාව පවතිනවා. විශේෂයෙන්ම මෙම ආවරණ ස්ථරය ජලය, තාර සහ රසායනික ද්‍රව්‍යයන් සඳහා ප්‍රතිරෝධකයක් ලෙස ක්‍රියා කරනවා. සාමාන්‍යයෙන් ඕනෑම වාහනයක වසර 02කට වතාවක්වත් බඳෙහි Cut & Polish එකක් සිදු කෙරෙනවා. නමුත් මාස 02 - 03 යන විට වාහන බඳෙහි වර්ණයේ දීප්තිය අඩු වීමක් දැක ගත හැකි වෙනවා. එලෙස වාහනය සඳහා සිදු කරන Cut & Polish එකත් සමඟ TowaBody Coating System සේවාවද වාහන බඳ සඳහා ලබා දෙනවා නම් වාහනයේ වර්ණය දීප්තිමත් ලෙස දිගු කාලයක් පවත්වා ගැනීමේ හැකියාව ලැබෙනවා. මෙම TowaBody Coating System මඟින් ඔබේ වාහනය පරණ වුවත් එයට අලුත්ම තත්ත්වයේ පෙනුමක් ලබා ගත හැකිය.

TowaBody Coating System අදියර 04කින් සමන්විත වෙනවා. වාහනයේ බඳෙහි වත්මන් ස්වභාවය සහ තත්ත්වය අනුව ඉන් කුමන අදියරයකින් ආරම්භ කරනවාද යන්න තීරණය කෙරෙනවා.



**■ TowaBody Coating System එකක් යෙදූ වාහනයක් පාවිච්චියේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?**

Sterling Aftercare මධ්‍යස්ථාන ඔස්සේ TowaBody Coating System එක සිදු කරගත් සෑම වාහන හිමියෙක්ටම Towa Pack එකක් ලබා දෙනවා. ඒ Pack එක වාහන බඳ පිසදැමීම සහ ආලේපන ගැල්වීම සඳහාම සුදුසු වන Cloth 03 ක්, සේදුම් කාරකයක්, බඳෙහි ඇතිවන පැල්ලම් පහසුවෙන් ඉවත් කළ හැකි ද්‍රාවණයකින් සමන්විත වෙනවා. අප ලබා දෙන Towa Pack එක නියමිත උපදෙස් පරිදි වාහනයේ බඳ සඳහා අලේප කිරීමයි TowaBody Coating System එකක් සිදු කළ සෑම වාහනයක් සඳහාම අප නිර්දේශ කරන්නේ. ඉන් දිග කාලයක් වාහනයේ බඳෙහි දීප්තිය සහ පෙනුම පවත්වාගත හැකි වෙනවා.



**■ මෙම බඳ ආරක්ෂණ පද්ධතිය යෙදීම සඳහා වැය වන මුදල පිළිබඳ සඳහන් කළොත්...**

මෝටර් රථ සඳහා TowaBody Coating System සේවාව රුපියල් 25,000/ සිට ඉහළට මුදලකට ඕනෑම ස්ටර්ලින් සේවා මධ්‍යස්ථානයක් ඔස්සේ ලබා ගත හැකිය. මෝටර් රථ, ජීප්රථ, වෑන් රථ ඇතුළු ඕනෑම වාහනයක් සඳහා TowaBody Coating System සේවාව ලබා ගැනීමට අවශ්‍ය නම් පාරිභෝගිකයන් තමාට ළඟම පිහිටි ස්ටර්ලින් සේවා මධ්‍යස්ථානයේ වේලාවක් වෙන් කරගෙන පැමිණීමයි සිදු කළ යුත්තේ.

**■ නියම ජපන් වාහන අමතර කොටස් ස්ටර්ලින් සේවා මධ්‍යස්ථානවලදී ලබා ගත හැකියි නේද?**

ඔව්. ස්ටර්ලින් ඕනෑම මධ්‍යස්ථානයක් ඔස්සේ ජපන් වාහන සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ හැකියාව පාරිභෝගිකයන් සඳහා අප උදා කර දී තිබෙනවා. ඒ අනුව Welcome Lights, Door Visors, Carpets ආදී වාහන අමතර කොටස් මිලදී ගන්න පුළුවන්. ඊට අමතරව පාරිභෝගිකයන් විසින් සිදු කරන ඉල්ලීම්වලට අනුව අවශ්‍ය අමතර කොටස් ජපානයෙන් ආනයනය කිරීමටද අප බැඳී සිටිනවා.

**■ අනෙකුත් වාහන සඳහා පවතින සේවා මධ්‍යස්ථාන හා සසඳන විට ස්ටර්ලින් Aftercare Centre හි විශේෂත්වයන් මොනවාද?**

Sterling Aftercare Centre හි ක්‍රමානුකූල සැලසුම් සහගත බවකින් යුතුව ඔබේ වාහනයට අවශ්‍ය සේවාව ලබා දීමට නිරතුරුවම කටයුතු කරනවා. දැනට ලංකාවේ වාහන Service කිරීම හා අලුත්වැඩියාව සම්බන්ධ නවීනතම තාක්ෂණය සහ ඊට අවශ්‍ය හොඳම අමුද්‍රව්‍ය, උපාංග අප සතුයි. ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථානවල සේවයේ නියුතු සියලු තාක්ෂණික සහ කාර්මික ශිල්පීන් ජපන් තාක්ෂණික දැනුමින් සන්නද්ධයි. ජපන් තාක්ෂණික විශේෂඥයින්ගේ (Japanese Technical Experts) සහය නිරතුරුව අප සමාගම ලබා ගන්නේ පාරිභෝගිකයින්ට ගුණාත්මක, නවීන සහ යාවත්කාලීන වූ තාක්ෂණික සේවාවක් පිරිනැමීමේ අරමුණින්.

ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන මහර කඩවත, උඩහමුල්ල නුගේගොඩ, දූනගහමීතුවන්ගොඩ සහ ගාල්ල යන ප්‍රදේශයන්හි ස්ථාපිත කර තිබෙනවා. ඊට අමතරව ඔයිල් වර්ග හුවමාරු කිරීම සහ අමතර උපාංග සඳහාම විශේෂිත වූ ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථානයක් නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා. අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) ඔස්සේ ඔබගේ වාහනයට උපදේශක (Service Advisor) කෙනෙකුගේ සේවය ලැබෙනවා. වාහනයට හිතකර සහ අහිතකර තත්ත්ව, වාහනයේ අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. මෙහි පවතින විශේෂත්වය වන්නේ ඔබගේ වාහනය අපගේ සේවා ස්ථානයට ඇතුළත් කළ අවස්ථාවේ පටන් ඔබේ වාහනය සඳහාම විශේෂ වූ සේවා උපදේශකවරයෙක් වෙන්ව කටයුතු කිරීමයි.




TowaBody Coating System සේවාව ඇතුළුව Sterling Aftercare සේවාවන් සහ අලුත්වැඩියාව සම්බන්ධව සියලු තොරතුරු 0117 600 800 යන අපගේ පාරිභෝගික සේවා දුරකථන අංකය ඇමතීමෙන් ලබා ගත හැකියි.

**■ හෂිනි ඉරේෂා ගුණවර්ධන**

